# "බමුණු කුලය" හිස ඔසවයි

## ක්‍රිකට් සැණකෙලිය අපේ කලාපයේ ඇරැඹුණේය.

ආරම්භක උත්සවය දැවැන්ත සන්දර්ශනයකින් පැවැත්වුණේ බංගලාදේශයේ ඩකා අගනුවරය. ශ්‍රී ලංකා පිලේ නායක කුමාර සංඝක්කාර ඇතුළු කණ්ඩායම් නායකයන් 14 දෙනා උත්සව භූමියට රැගෙන යන ලද්දේ බංගලාදේශයේ පමණක් නොව, සමස්ත ඉන්දීය උප මහාද්වීපයේම පොදු ජනතාවගේ වාහනය වූ බයිසිකල් රික්ෂෝවලිනි.

බයිසිකල් රික්ෂෝව ලංකාවේ පාරවල්වල කවරදුවත් ධාවනය වූයේ නැත. එහෙත් අපේ හුදී ජනයා සිය දහස් ගණනින් බක්කි කරත්ත වලින් ගමන් ගියහ. ඉන්දීය උපමහාද්වීපයේ රටවල ද ජනතාව දහස් ගණනින් අශ්ව කරත්ත වලින් ගමන් කළහ. ඔවුහු අදත් එසේ ගමන් කරති. එහෙත් අපේ රටේ පොදු ජනයාගේ වාහනය වී ඇත්තේ කෝටි ගණනින් විදේශ විනිමය වැයකොට ගෙන්වන ත්‍රීවිල් රථය.

ඉන්දියාවේද ත්‍රීවිල් රථ ඕනෑතරම් ඇත. ඇත්ත වශයෙන් ඒවා 90% ක් නිපදවන්නේ ඉන්දියාවේ ය. ත්‍රීවිල් කොපමණ දිවිවත් අශ්ව කරත්ත හා බයිසිකල් රික්ෂෝ ඉන්දියාවේ පාරවල් වලින් ඉවත් වන්නේ නැත.

බනිජ තෙල් අර්බුදය ඇරඹුණ දා පටන් ඉන්දියානු රජය විදේශ විනිමය රැක ගැනීම සඳහා ක්‍රමානුකූල පියවර ගත්හ. විදේශ මෝටර් රථ ආනයනය සීමා කරන අතර ඉන්දියාවේ නිපදවන මෝටර් රථ පවා අලෙවි කරන ලස්සේ පාලන ක්‍රමයක් අනුවය. එසේ කරන ලද්දේ නිදහසින් පසු 60 වසරක් තිස්සේ ඉන්දියාවේ ස්ථාපිත වී ඇති ක්‍රම සම්පාදන සැලසුම් නිසාය.

දැන් අපි යළිත් වරක් ක්‍රිකට් සැණකෙලිය දෙස බලමු. මේ සැණකෙලිය පැවැත්වෙන රටවල් අතුරින් අතිශයෝක්තිය හා වියරුව පිළිබඳ සම්මාන ලැබෙනොත් නිසැකවම ජයග්‍රහණය ලබා, සම්මාන ද ලබන්නේ ශ්‍රී ලංකාව ය.

අද උණුසුම ඇත්තේ ක්‍රිකට් සැණකෙලිය කෙරෙහි ද? නැත්නම් ඉදිරියේ එන පළාත් පාලන මැතිවරණය කෙරෙහි ද? එසේත් නැත්නම් ගංවතුර කෙරෙහිද? නොඑසෙ-"නම් එළවළු මිල කෙරෙහිද? යන්න ගැන ජනමත විචාරණයක් පැවැත්වුවහොත් 80% ට වැඩි ප්‍රතිශතයක් ලබා ක්‍රිකට් ජය ගනු ඇත.

අපේ ක්‍රිකට් උන්මාදය කෙතරම් වි ද යත් ඒ නිමිත්තෙන් විශේෂයෙන් පබඳන ලද ගීත වලින් විසුත් මාධ්‍ය ගිගුම් දුන්නේය. එම ගීත වලින් අපි තරගයට එන අනෙක් රටවල් අවඥාවට, සමච්චලයට හා පාච්චලයට ලක් කළෙමු. වාසනාවකට මෙන් මේ "ඊ නියා දේශප්‍රේම් ගීත" ගැන සැලවූ වහාම මගින්ද රාජපක්ෂ ජනාධිපති තුමා ඒවා නවත්වන ලෙස නියෝග කිරීම ප්‍රශංසනීයයි.

ඉතිහාසය පුරා අපි ක්‍රීඩා තරඟවලදී වියරුවෙන් ක්‍රියා කිරීම සෝචනීයය. අපි ජයග්‍රහණයෙන් උද්දමි වනවාත් මෙන්ම පරාජයේදී නිවට නිසාලු කෝපයට පත් වන්නෙමු. අපේ අයට ඕන කරන්නේ ජයග්‍රහණය පමණකි. උදාහරණ දෙකක් පෙන්වනු කැමැත්තෙමු.

ඉන්දියාව හා පකිස්තානය දෙකඩ වීමෙන් පසු දෙරට අතර පළමුවන ටෙස්ට් ක්‍රීඩා උළෙල විවෘත කරමින් අගමැති ශ්‍රී ජවහර්ලාල් නේරු කළ ප්‍රකාශය මෙසේය.

"අපේ කලාපයට ක්‍රිකට් හඳුන්වා දුන් ද පටන් එක පිළක් වූ අපි අද දෙපිළක් වී තරඟ කරමු. දෙපිළක් වුවද තරගය සුභද විය යුතුය. වඩා දක්ෂ ලෙස ක්‍රීඩා කරන කණ්ඩායමට ජය ලැබේවා යැයි මම ප්‍රාර්ථනා කරමි."

ලංකාවේ ප්‍රධාන බෞද්ධ විද්‍යාලය වූ ආනන්ද මහා විද්‍යාලයට අඩසිය වසක් ගතවන තුරු ක්‍රීඩා භූමියක් නොලැබිනි.

1974 පමණ දීර්ඝ අරගලයකින් පසු විද්‍යාලයට යාබද ඉඩමක ක්‍රීඩා භූමියක් ඉදිකිරීම ඇරැඹුනි. ක්‍රීඩා භූමිය විවෘත කරන ලද්දේ 1977 දී ය. විවෘත කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ නව රජයේ අගමැති ජේ. ආර්. ජයවර්ධන මහතාය. අලුත් ක්‍රීඩාංගනයේ පළමුවන තරඟය වශයෙන් නම් කර තිබුණේ ආනන්ද හා රාජකීය (සෘදන්ක) විද්‍යාල අතර තරගයයි.

ප්‍රධාන ආරාධිත අමුත්තා වූ අගමැති ජේ. ආර්. ජයවර්ධන මහතා සිය කතාවේදී මෙසේ පැවසීය.

"ආනන්ද විද්‍යාලයට ක්‍රීඩා භූමියක් ලැබීම ගැන මම සන්තෝස වෙනවා. මේ ක්‍රීඩා භූමියේ පළමුවන තරගය තිබෙන්නේ ආනන්ද විද්‍යාලය හා රාජකීය විද්‍යාලය අතරයි. දෙවැනි තරගය තිබෙන්නේ ආනන්ද විද්‍යාලය හා ධර්මපාල විද්‍යාලය අතරයි. මේ පළමුවැනි තරගයෙන් රාජකීය විද්‍යාලය ජයග්‍රහණය කොරාවි කියලා මං ප්‍රාර්ථනය කරනවා. දෙවන තරගයෙන් ධර්මපාල විද්‍යාලය පරදවා ආනන්ද විද්‍යාලය ජයග්‍රහණය කොරාවි කියලා මං ප්‍රාර්ථනා කොරනවා"

මේ කතාවෙන් පසු ආනන්ද මහා විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙක් හා දීර්ඝ කාලයක් එහි ගුරු වෘත්තියේ ද යෙදුණු කලක් කිර්තිමත් ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ ජේෂ්ඨයෙක් සිය මිතුරෙකුගේ කතට කොඳුරා මෙසේ කීවේය.

"පනස් හයේ ගියා 77 ආයේ ආවා"
"මොකක්ද ?" මිතුරා ඇසුවේ ය.
"බමුණු කුලය" කෙටි පිළිතුරයි.



ඉන්දියාවේ බිවපු හියෝජිත මහ කොමසාරිස් ප්‍රවීණ මාධ්‍යවේදී ඇස්.පියසේන

පනස් හයට පෙර තිබුණු බමුණු කුලය කෙබඳු වීද?

පනස් හයට පෙර තිබු රජයේ අගමැතිවරයා ගැන හා ඔහුගේ රාජකාරිය ඉටු වූ අන්දම ද, විස්තර කරමින් වසර 50 ක් පමණ එම අගමැතිවරයා සෙවණේ කීකරුව සේවය කළ අදත් ඒ නමට පවා ලෙන්ගතුව වැඩකරන සේවකයෙක් නොබෝදා පුවත්පතට කළ විස්තරයෙන් කොටසක් පළකිරීම උචිතය.

"අපේ සර්ට සෙකට්‍රලා විස්සක් විතර හිටියා. ඔක්කොම නෝනලා. ලස්සන නෝනලා. මේ ඔක්කොම ලොකු පවුල්වල සල්ලිකාර වංසවත් නෝනලා. එත්නෙත් ලොකු කාර්වලින්. රස්සාවට අවෙ පඩියට නෙවෙයි. ආසාවටයි, නම්බුවටයි. ඒ ගොල්ලො පඩි ගන්න අය නොවෙයි."

එම සේවකයා තව දුරටත් මෙසේ කීවේ ය.

"සර් දවාලට බත් කෑවේ නෑ. ඒත් බත් තරමටම මස් කෑවා. දවාලට බිව්වේ පීන් නැත්නම් වයින්."

"සර් ලංකාවේ වතුර බිවේ නෑ. ඔහු ප්‍රංසයෙන් මිනරල් වතුර බෝතල් ගෙන්වා ගත්තා. මාසෙකට තරං සෑහෙන තරම් ලීටර් එකහමාරේ වතුර බෝතල් කන්ටේනරයක් ගෙන්වා ගත්තා. ඔහු ඒ අතර ඊළඟ කන්ටේනරය ප්‍රංසයෙන් ඇණවුම් කළා. ඔහු මැරෙන තුරුම බීවෙ ප්‍රංශයෙන්ම ගෙන්වාගත් වතුරයි. මෙය බොහෝ දෙනා නොදන්න අප්‍රකට පුවතක්" යැයි එම සේවකයා පුවත්පතට පවසා තිබේ.

අතීත දේශපාලන නායකයන් පිළිබඳ මේ තොරතුරු ගෙන හැර පෑවේ විවෘත ආර්ථිකයෙන් පසු ශිෂ්‍යයෙන් මුදල් පසු පස හඹා යන අපේ සමාජය වෙනස් කිරීමට දැන් කාලය එළැඹ ඇති බව පෙන්වා දීමටය.

## රසික සූරියආරච්චි




මා, එච්. එච්. කරුණාරත්න කවියා මුලින් ම දුටුවේ වසර 2005 අග භාගයේ දී "ස්කැට්ස්" සංවිධානය විසින් සිඩ්නි නුවර පවත්වන්නට යෙදුණු සාහිත්‍ය චින්තා කවි සමුළුවේ දී ය. එදින ඔහු ලියූ සාහිත්‍යමය ලිපියක් කියවූ බව ද, ඔහු විසින් රචිත කවි පන්තියක් රස විඳි බව ද, මගේ මතකයේ ඇත.

එතැන් පටන් පසුගිය පස් වසර තුල කරුණාරත්නයන් විසින් පබැඳුණු කවි පන්ති කිහිපයක් ම අසා, කියවා, රස විඳින්නට මට ඉඩ කඩ ලැබුණි.

"හෙළ දම් පැදි වැල" නමින් පසුගිය ද ප්‍රකාශයට පත් වුණු එච්. එච්. කරුණාරත්න කවි එකතුව පිළිබඳව මා මේ කෙටි සටහන තබන්නේ ඒ පසුබිම තුළ හිඳිමිනි.

තමා කවියෙක් නොවන බව නිරහංකාරව ලෙස පෙරවදනේ සඳහන් කළ ද, එච්.එච්. කරුණාරත්නයෝ දීර්ඝ කාලයක් තිස්සේ කාව්‍ය රචනාවෙහි යෙදුණු පලපුරුදු කවියෙකු වෙති. මේ කාව්‍ය සංග්‍රහයේ අඩංගු කර ඇති විවිධ විරිතින් පබැඳුණු සඳැස් කවි මෙන්ම සැහැලි වර්ගයේ රචනාවලින් ද ඒ බව මනාව සාධනය වේ. ගණනින් එකුන් සැටක් වූ මේ කාව්‍ය දම් පැදිවැල කෘතියෙහි එන පදවැල් අතරට එක් කිරීමට කරුණාරත්න යෝ උත්සුක වීම ද පැසසිය යුතු කරුණකි. විගාමික සිංහල සාහිත්‍යයක පිබිදීමට ඉන් ලැබෙන රුකුල මම මෙහි ලා අගය කරමි.

# විගාමික සිංහල සාහිත්‍යයට සදහම් සුවඳක් "හෙළ දම් පැදි වැල"


එච්. එච්. කරුණාරත්න

පන්තීන් ගෙන් බහුතරයක් ම බෞද්ධ චින්තනය මත පදනම්ව, බොහෝ විට ධර්ම කරුණු පිළිබඳව රචිත ඒවා වීම ජීවිතයේ සැදෑ කාලයේ පසුවෙන අප වැඩිහිටි පරපුරට මෙන්ම, මැදි විය පසු කරමින් සිටින අපේ පරම්පරාවේ බණට, දහමට නැඹුරු සිත් ඇත්තන් හට ද සතුට දනවන කරුණක් වෙනු ඇත.

පන්සල කේන්ද්‍ර කොට ගත් බුද්ධාගම නමැති සංස්ථාව වෙත අප බැඳ තබා ගන්නා ආමිස පූජාවන් හි ප්‍රධාන තැනක් ගන්නා (බෝධි) වෘක්ෂ වන්දනාව සහ (බුදු) පිළිම වන්දනාව යන වන්දනා ද්විත්වයේ හි දී ම, සුගම විරිතට පබැඳිව, සුමුදු හඬින් ගැයෙන සිංහල කවි සහ පාලි ගාථා සාර්ථකව යොදු ගන්නා බව අප හොඳින් දන්නා කරුණකි.

ඒ අනුව බලන කල, "හෙළ දම් පැදි වැල" කාව්‍ය සංග්‍රහයේ අතුලත් කාව්‍ය නිර්මාණ බොදු චින්තනය මත පදනම් වූ දිවි මගකට පාඨකයා යොමු කරවන ආකාරයේ ප්‍රභල විභවයක් ඇති රචනා බවට සැකයක් නැත.

අතැම් ගැඹුරු දහම් කරුණු පවා කරුණාරත්නයන් ගේ කාව්‍යමය හැකියාව හමුවේ සුගම පදවැල් බවට පෙරළී ක්‍රමිකව ගලා යයි. මා මේ කෘතියේ දුටු තවත් එක් සුවිශේෂී ලක්ෂණයක් නම්, බුදුගුණාලංකාරයේ අප කියවා ඇති ආකා රයේ කෙටි මාත්‍රාවෙන් යුතු කවි ප්‍රභල අරුත් හුවා දැක්වෙන අයුරින් පබැඳී ඇති ආකාරයයි.

උපන් බිමේ දිගු කලක් තිස්සේ කළ මෙහෙය නිමවා, විශ්‍රාමික සංක්‍රමණිකයෙකු ලෙස මේ " දකුණු කුරු දිව" ට පැමිණ තමා ලද ඒ විප්‍රවාසී අත්දැකීම් ද කවි බසට පෙරළා, හෙළ දේශපාලන කසල ගොඩ ට සහ එහි ඉහඳ තබන හිලමැස්සන් ට වන්දිබිරිටකම් කෙරෙන "යුග පෙරළිය" නම් වූ කවි පෙල හමුවේ කිලිටි කර නොගෙන මා දෙනෙත වසාලමින්, "හෙළ දම් පැදි වැල" නමැති මේ කිරි කලය, කිරි කලයක් ලෙස ම හුවා දැක්වීමට මම කැමැත්තෙමි.

"හෙළ දම් පැදි වැල" කෘතියෙහි අඩංගු දම් පැදි වැල් කියවන, අසන, සෑම සිතකම දම් සිතුවිලි පහල වේවා, ඒ සිත් නිවේවා, සුවපත් වේවා යන්න මගේ පහන් පැතුමයි.

උපත සහ විපත අතර දුකෙහි ගැලෙමින්, සැපත සොයමින් අප ගෙවන මේ කෙටි ජීවිත කාලය අවසානයේ දී යම් ප්‍රයෝජනවත් වැඩක් කළා යයි සතුටු වීමට නම් "ගසක් වවා, පුතෙක් හදා, පොතක් ලියා තිබිය යුතු ය" යනුවෙන් වැඩි දෙනෙකු නොදන්නා කියමනක් වේ.

සිඩ්නි නුවර අප අතර වෙසෙන කරුණාරත්නයන් තම දිගු ජීවිත කාලය තුල අනේක සංඛ්‍යාවක් ගස් වවා ඇතැයි මම සිතමි. ඔහු රටට වැඩ දයක දූ පුතුන් හදා ඇති බව ද අපි මැහවින් දනිමු.

"හෙළ දම් පැදි වැල" නමින් මේ කෘතිය නිර්මාණය කිරීම තුළින් ඉහත කී තෙවැනි විවරණය ද එච්. එච්. කරුණාරත්නයන් ලබා ඇති බව කරුණා සිතින් යුතුව ඔබ සැමට මෙලෙස ලියා දන්වමි.

සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net